# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1880/21 – 2014 සැප්තැම්බර් 17 වැනි බදාදා – 2014.09.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, හලා/වෙන්/තල්දෙක කණිෂ්ඨ විද්‍යාලය සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කම්මල්පත්තුව සුළු කොට්ඨාසයේ, තල්දෙක ගමේ පිහිටි පුත්තලම කොට්ඨාසය භාර මැනුම් අධිකාරි විසින් 2006.11.15 දිනැතිව සකස් කර ඇති අංක පු/වෙන්/2006/380 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'අ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.202 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'අ' – මාදන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.202ක් පමණ

උතුරට: ඩබ්ලිව්. ඕ. එච්. මිල්ටන් කුරුස්ෂු හිමිකම් කියන මාදන්ගහවත්ත; නැගෙනහිරට: කැබලි අක්ෂර ආ; දකුණට: මාර්ගය; බටහිරට: ඩබ්. මර්ලින් ඉග්නාසියුස් පෙරේරා සහ ඒ. මේරි බියුලට් පෙරේරා හිමිකම් කියන මාදන්ගහවත්ත.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

ඉඩම් අමාත්‍යාංශ අංකය: එල්ඩී/05/2006/ඊ/191.
2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 184


1A – G 20273 – 15 (2014/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.